# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2023 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2023 සැප්තැම්බර් මස 08 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2023 සැප්තැම්බර් මස 08 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 12.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2023 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2023 සැප්තැම්බර් මස 08 වන දින]

එල්.ඩී.—ඕ. 54/2022

**2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2023 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 2022 අංක 25 දරන පනතේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

(1) එහි Iඅ කොටසෙහි-

(අ) 23 වන අයිතමයෙහි "එකී ද්‍රව්‍ය සපයන තාක් දුරට එකී ද්‍රව්‍ය; සහ" යන වචන වෙනුවට, "එකී ද්‍රව්‍ය සපයන තාක් දුරට එකී ද්‍රව්‍ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) 24 වන අයිතමයෙහි "යන්ත්‍රෝපකරණ හෝ උපකරණ." යන වචන වෙනුවට, "යන්ත්‍රෝපකරණ හෝ උපකරණ;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) 24 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම එකතු කිරීමෙන්:-

"25. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බද්දට යටත් වන සහ රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගනු ලැබූ ආනයනය කරනු ලබන යම් මෝටර් රථයක්;

26. වෙනස් හැකියාවන් සහිත පුද්ගලයන් විසින් භාවිත කරනු ලබන උපකරණ;

27. 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 15 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් දරනු ලබන තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවට බැංකුවක් හරහා ප්‍රේෂණය කරනු ලබන විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීමට, කපා ඔපදමා ප්‍රතිඅපනයනය කිරීමේ කාර්යය සඳහා ආනයනය කරනු ලබන, රළු පිරිසකසනු නොලැබූ මැණික් ගල්;

28. තීරු බදු රහිත වෙළඳසැල්වල විකුණනු ලබන යම් ද්‍රව්‍යයක්; සහ

29. දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද වී වලින් නිෂ්පාදිත සහල්.";

(2) එහි II කොටසෙහි-

(අ) 1 වන අයිතමය වෙනුවට, පහත අයිතමය ආදේශ කිරීමෙන්:-

"1. 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බෙදාහැරීමේ බලපත්‍රයක් දරනු ලබන යම් තැනැත්තකු විසින් විදුලි බලය සැපයීම හැර විදුලි බලය උත්පාදනය කිරීම සහ විදුලි බලය සැපයීම;";

(ආ) 22 වන අයිතමයෙහි "සපයනු ලබන සේවා; සහ" යන වචන වෙනුවට, "සපයනු ලබන සේවා;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) 23 වන අයිතමයෙහි "සපයනු ලබන යම් සේවාවක්." යන වචන වෙනුවට, "සපයනු ලබන යම් සේවාවක්; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඈ) 23 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"24. 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 97 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ගුවන් ප්‍රවාහන සේවා බලපත්‍රයක් දරනු ලබන යම් සාමාන්‍ය අලෙවි නියෝජිතයකු විසින් සපයනු ලබන සේවා.".

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.